

## මොණරු නිදැල්ලේ සැරිසරන
# කොහොඹ තුරු අරණක පැවති පරිසර සමුළුව.....

ඉන්දියාවේ ගුජරාටි ප්‍රාන්තයේ, අහමදාබාද් නගරයේ, ශ්‍රී ජවහර්ලාල් නේරු පරිසර අධ්‍යාපන මධ්‍යපස්ථානයේ, 1995 වසරේදී, පැවැත්වූ පරිසර අධ්‍යාපන සමුළුවකට සහභාගී වීමට මට අවස්ථාවක් ලැබුණි. එවකට මා සේවය කරන ලද්දේ ශ්‍රී ලංකාවේ පරිසර අමාත්‍යංශය යටතේ පැවති නොරාඩ් (NORAD) පරිසර ව්‍යාපෘතියේ වැඩ සටහන් නිලධාරිවරයා ලෙසටය.

ශ්‍රී ලංකාවෙන් පිටත් වූ මට මදුරාසියෙන් ගොඩ බැස, මදුරාසියේ සිට බොම්බායටත් බොම්බායේ සිට අහමදාබාද් නගරයටත් අභ්‍යන්තර ගුවන් සේවා මගින් යාමට සිදුවිය. ආරම්භක සැසියේ ප්‍රධාන අමුත්තා වූ ප්‍රාන්ත අධ්‍යාපන අමාත්‍යවරයා ගුජරාටි භාෂාවෙන් සහ ඉංග්‍රිසියෙන් සිය දේශනය කළේය. විනාඩි පහකට පමණ සීමාකළ ඔහුගේ දේශනයේදී, අනාගතයේදී



## ආ මග සටහන්

දයාරත්න වීරසේකර
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ
විශ්‍රාමික, නියෝජ්‍ය විභාග කොමසාරිස්

බලාපොරොත්තු විය හැකි ස්වාභාවික විපත් ගැන සඳහන් කර ඒවා කළමනාකරණය සඳහා දරුවන් වහ වහා යොමු කළ යුතු ආකාරය ගැන කදිම විස්තරයක් කරන ලදී.

එම මධ්‍යස්ථානයේ පවත්වන ලද ආරම්භක පරිසර අධ්‍යාපන පර්යේෂණ වැඩ සටහන මෙය විය. මේ පිලිබඳව පරිසර අමාත්‍යංශයට දන්වා තිබුණු ලිපියකට අනුව සමුළුවට සහභාගී වීම සඳහා මා නම් කරන ලදී.

ඉන්දියාවේ ප්‍රාන්ත සියල්ලෙන්ම පරිසර අධ්‍යාපන නියෝජිතයින් (ගුරුවරු සහ නිලධාරින්) පැමිණ සිටියහ. විදේශිකයෙකු සිටියේ මා පමණකි එම සමුළුවේ විශේෂත්වයක් විය. කාල සටහනට අනුව පළමු සැසියේ වුයේ එක් එක් නියෝජිතයාගේ ප්‍රාන්තයේ පරිසර අධ්‍යාපන කටයුතුවල ප්‍රගතිය පිළිබඳව කෙටි විග්‍රහයක් කිරීමයි. එම අවස්ථාව එළඹී විගසම කාටත් අවශ්‍ය වුයේ, එකම විදේශික අමුත්තා වූ මගෙන් ශ්‍රී ලංකාවේ පරිසර අධ්‍යාපනය ගැන දැනගැනීමටයි. මට කළ ආරාධනය සතුටින් භාර ගතිමි. මා හට අපේ පරිසර ක්‍රියාකාරකම් ගැන මනා අවබෝධයක් තිබුණු නිසා ඉතා හොඳ විස්තරයක් කළ හැකි විය. එය අසා කව්රුත් සතුටට පත්වූහ.

සමුළුව සඳහා තිස් හය දෙනෙකු සහභාගී වූහ. තුන් වන දිනය වන විට සියල්ලෝම වගේ මා සමග ඉතා කුළුපග විය. මෙම සමුළුවට සහභාගී වුවන්ගේ තවත් විශේෂත්වයක් වුයේ පිරිසේ අය විවිධ ප්‍රාන්ත භාෂා කථා කරන අය වීමයි. කාටත් පොදු භාෂාව වුයේ ඉංග්‍රිසි යි. පිරිමින් කලිසම, ෂර්වානිය, හෝ පන්ජාබි ඇඳුම ඇඳ සිටියහ. තලප්පාව බැඳගත් එක් අයෙක් සහ සුදු පැහැති මුස්ලිම් හිස් වැසුම පැළඳි දෙදෙනෙක්ද විය. පිරිසේ සිටි කාන්තාවන් කිහිප දෙනාද සාරිය, සල්වාරිය, ඩෙනිම් කලිසම වැනි විවිධ ඇඳුම් ඇඳි අය වූහ.

අපට දින පතාම විවිධ පරිසර පද්ධති නිරික්ෂණය කිරීමටත් ඒවායේ විවිධ අධ්‍යයන කිරීමටත් පහසුකම් සලසා තිබිණ. අප ක්ෂේත්‍ර අධ්‍යයන වල නිරත වූයේ කුඩා කණ්ඩායම් වශයෙනි. දින පතාම අධ්‍යයන කණ්ඩායම වල සිටින පිරිස වෙනස් කළ නිසා සෑම කෙනෙක් සමගම සුහදව කටයුතු කිරීමට හැකිවිය.

මෙම පරිසර අධ්‍යපන ආයතනය පිහිටි භූමිය අක්කර පණහක පමණ විශාල ප්‍රදේශයකි. එම මුළු ඉඩම කොහොඹ ගස් වලින් පිරුණු වනාන්තරයක් බඳු විය, ඒ වන විට ශීත ඍතුව එළඹ තිබුණු නිසා බිම පතිත වි තිබුණු ඉදී ගිය කහ පැහැති කොහොඹ කොළ නිසා මුළු ප්‍රදේශයම කහ පැහැති පළසකින් වසා ඇති අයුරු දිස්විය

මෙහි තවත් සුවිශේෂී දෙයක් වුයේ එම වන අරණ පුරාම මොණරු සිය ගණනක් සිටීමයි. වරින් වර සම්මන්ත්‍රණ ශාලාව ඇතුළටද එන මොණරු වැඩ කටයුතු වලටද තරමක් බාධා පමුණුවති. එහෙත් කිසිවකු ඒවා නොසලකා හරිති. කෙසේ වෙතත් මොණරකු ඉඳහිට පිල් විදහා නැටීම කාටත් ආශ්වාද ජනක දර්ශනයක් විය.

රංචුවෙන් වෙන්වී හුදකලාවේ සිටි රිළවෙකු සහ මොණරු අතර තිබුණු මිත්‍රත්වයක්ද විශේෂයෙන් සඳහන් කිරීම වටි. මොණරු වතුර බිම සඳහා ජල කරාමයක් වෙත ආ විට මෙම රිළවා කරාමය ඇර ඔවුනට වතුර බිමට සලස්වා ආපසු කරාමය වසා දැමීම මෙහිදී දකින්නට ලැබුණු අරුම පුදුම දර්ශණයකි.

ගුජරාටි ප්රාන්තය එළු මස් සඳහා ප්රපසිද්ධියක් උසුලන ප්රටදේශයක් වුවද, සමුළුව පැවති මුළු සතියේ සෑම කෑම වේලක්ම නිර්මාංශ ආහාර වීමද මෙහි තවත් සුවිශේෂී දෙයකි. අපේ ආහාරයක්ෟ සාදන ආකාරය පිළිබඳව ආපන ශාලා අංශයට විස්තර කර දෙන ලෙස මගෙන්ද ඉල්ලීමක් කරන ලදී. මම පොල් සම්බලයක් සාදන ආකාරය කියා දුන්නෙමි. එය කිහිප දෙනෙකුට අමුත්තක් නොවිය. කෙසේ වෙතත්, කවුරුත් පොල් සම්බලය රස කර කර ඉඳි ආප්ප සමග භුක්ති වින්දහ. මේ අයුරින් ඉන්දියාවේ එක් එක් ප්රාොන්තවල ආහාර එම සතිය තුළදී අපගේ කෑම වේල් වලට එකතු වීම නිසා ආහාර රසයෙහි විවිධත්වයක්ද විඳින්නට හැකිවිය.

වැඩ මුළුවේ දී විශේෂ අවධානය යොමු වූයේ පරිසරයට අදාළ නව සංකල්ප පාසැල් විෂයය මාලාවලට අන්තර්ග්රාහණය කිරීම පිළිබඳවයි. මෙහිදී ප්රාථමික සහ කණිෂ්ඨ ද්විතිය අවදියේදී, සිසුනට සමුහ ක්රී.ඩා ආශ්රිතව ආහාර දාම, ආහාර ජාල, පරිසර සංරක්ෂණය, අපද්රේව්‍ය කළමනාකරණය ආදී සංකල්ප ඉදිරිපත් කිරීමේ වැදගත් කම පෙන්වා දෙන ලදී. එසේම් ඉවතී යනුවෙන් තැනක්ෟ නොමැති බවත් ඉවත දැමීම් යන අදහස පරිසරයට බෙහෙවින් හානිකර වීම ඒත්තු ගැන්විය යුතු බවත් අවධාරණය කරන ලදී.



බිම එලන ලද පැදුරු මත වාඩිවී, දේශන වලට සවන් දීම



සහභාගිවූ පිරිසෙන් කොටසක්